# ලංසු සඳහා ආරාධනයයි

## මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා රේගුව

ශ්‍රී ලංකා රේගුව විසින් රාජසන්තක කරනු ලබන වාහන, බහාළුම් සහ පරීක්ෂණවලට යටත් කරනු ලබන මෝටර් රථ සහ බහාළුම් ගාල් කර තැබීමට 2026.03.01 සිට 2029.02.28 දක්වා වසර තුනක කාලයක් සඳහා ඉඩමක් කුලී පදනම මත ලබා ගැනීම සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු මෙයින් කැඳවනු ලැබේ. (ලිපිගොණු අංකය - CUS/LOG/S/20/2025- 01)

01. මේ සඳහා පහත දක්වා ඇති නිර්ණායකවලට අනුව පහසුකම් සැපයිය හැකි අයදුම්කරුවන්ට ලංසු ඉදිරිපත් කළ හැකිය.

I. වාහන අංගනය අවම වශයෙන් අක්කර තුනක් හෝ ඊට වැඩි ඉඩමකින් යුක්ත වීම.

II. ඉඩමේ අයිතිය තහවුරු කිරිම සඳහා ඉල්ලුම්කරු විසින් ඔප්පුව,බදු ගිවිසුම හෝ වෙනත් නීත්‍යානුකූල ලේඛණ ඉදිරිපත් කළ යුතුය.

III. අංගනය කොළඹ වරායේ සිට කි.මී.20 ක් ඇතුලත පිහිටා තිබිය යුතුය.

IV. වාහන අංගනයට රැගෙන එන වාහන සහ බහාළුම් බාධාවකින් තොරව ප්‍රවාහනය කළ හැකි වන සේ සුදුසු ප්‍රවේශ මාර්ග පහසුකම් තිබිය යුතුය.

V. අංගනය සම්පූර්ණයෙන් ආවරණය වන CCTV කැමරා පද්ධතියකින් සමන්විත විය යුතුය.

VI. රැගෙන එන වාහන සහ බහාළුම් පරීක්ෂා කිරීමේ පහසුකම්වලින් සමන්විත විය යුතුය.

VII. භාණ්ඩ පැටවීම සහ බෑම සඳහා ෆෝක් ලිෆ්ට් සහ ස්ටැකර් පහසුකම් සැපයුම්කරු විසින් ගාස්තුවක් රහිතව සපයා දිය යුතුය.

VIII. අවශ්‍ය අවස්ථාවලදී කොන්ත්‍රාත්කරු විසින් මිනිස් ශ්‍රමය ගාස්තුවක් රහිතව සැපයීමට කටයුතු කළ යුතුය.

IX. ගබඩා ප්‍රදේශය - ආවරණ සහිත ප්‍රදේශය වර්ග අඩි 50,000 ක් පමණ විය යුතු අතර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන අවස්ථාවේ එම වර්ග අඩි 50,000 ක ප්‍රමාණය නොමැතිනම් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් මසක් ඇතුලත සම්පූර්ණ ආවරණ ප්‍රදේශය සකස් කර දිය යුතුය. ඉතිරි ප්‍රදේශය ආවරණ රහිත විය හැකිය. ආවරණ සහිත ප්‍රදේශයෙන් අවම වශයෙන් වර්ග අඩි 10,000 ක ප්‍රදේශයක්වත් උස මීටර් 06 ක් විය යුතුය.

X. නිලධාරීන් සඳහා කාර්යාලයක් තිබිය යුතු අතර සහකාර නිවාරණ නිලධාරීන් දෙදෙනකු සහ රේගු පරීක්ෂකවරුන් දෙදෙනෙකුට නවාතැන් ගැනීමට සහ ආහාර ගැනීමට ඉඩකඩ සහිත සහ යාබද වැසිකිලි පහසුකම් සහිත විවේක කාමර දෙකක් තිබිය යුතුය. එම ඉඩ කඩ වර්ග අඩි 1,000 කට නොඅඩු විය යුතුය.

XI. අවම වශයෙන් නිලධාරීන්ගේ සහ සේවාලාභීන්ගේ වාහන 10 ක් ගාල් කිරීමට ඉඩ පහසුකම් තිබිය යුතුය.

XII. සම්පූර්ණ ඉඩම වටා අවම වශයෙන් අඩි 12 ක් උස තාප්පයකින් සහ ඊට ඉහලින් අඩි 02 ක් උස කම්බි දැලකින් ආරක්ෂා කළ යුතුය.

XIII. අංගනයේ තාර අතුරා තිබිය යුතුය. තවද වැසි ජලය බැස යාමට සුදුසු පරිදි කාණු පද්ධතියක් තිබිය යුතුය.

XIV. ගිනි ස්වභාවික විපත් හා කැරලි කෝලහල ඇතුළුව පූර්ණ රක්ෂණ ආවරණයක් ලබා දිය යුතුය.

XV. පැය 24 පුරා සේවාව සැපයීමට හැකියාව තිබිය යුතුය.

XVI. පැය 24 පුරාම සහ දින 7 හිම ආරක්ෂක සේවාවක් සැපයිය යුතුය.

XVII. පාරිභෝගික සත්කාරය පිළිබඳ මනා අවබෝධයක් ඇති අවම කාර්ය මණ්ඩලයක් සේවයේ යෙදවිය යුතුය.

02. ලංසු ලේඛණයේ 1 වන වගන්තියේ ඇති උපදෙස් අනුව ලංසු ලේඛණ ඉදිරිපත් කළ යුතුය. සියළුම ලංසු රුපියල් 50,000.00 ක ලංසු ඇපකරයක් සහිතව ඉදිරිපත් කළ යුතුය.

03. අභිලාෂී ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු අවශ්‍යවන්නේ නම් දුරකතන අංක 011–2221680 ඔස්සේ රේගු අධ්‍යක්ෂ (සේවා සැපයුම්), වෙතින් ලබා ගත හැකිය. එසේම 2026.01.14 දින සිට 2026. 02.05 දින ප.ව.9.30 සිට ප.ව.3.00 දක්වා ආපසු නොගෙවනු ලබන රු.3,000.00 ක තැන්පත් මුදලක් ගෙවීමෙන් අනතුරුව පහත සඳහන් ලිපිනය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට සකස් කරන ලද ලංසු ලිපි ලේඛණ කට්ටලක් මිලදී ගත හැකිය. ඒ සඳහා ගෙවීම් කළ හැක්කේ මුදලින් පමණි.

04. සියළුම ලංසු **රේගු අධ්‍යක්ෂ (සේවා සැපයුම්) සේවා සැපයීම් අංශය, 6 වන මහල, රේගු මන්දිරය, අංක 40, කෙළින් වීදිය, කොළඹ 11** ලිපිනයට 2026.02.06 දින ප.ව.2.00ට පෙර ලැබෙන සේ ලියා පදිංචි තැපෑලෙන් යොමු කළ යුතු අතර නොඑසේ නම් සේවා සැපයුම් අංශයේ තබා ඇති ප්‍රසම්පාදන පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම සිදු කළ යුතුය. එදින ප.ව.2.00 න් පසු ලැබෙන ලංසු ලේඛණ ප්‍රතික්ෂේප කරනු ලැබේ. මිල ගණන් බහා එවන කවරයේ වම්පස කෙළවරේ "වාහන සහ බහාළුම් ගාල් කර තැබීමට සුදුසු ඉඩමක් කුලී පදනම මත ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම " ලෙස සඳහන් කර එවිය යුතුය.

05. තවද 2026.02 .06 දින ප.ව.2.00 ට ඉහත අංක 04 හි සඳහන් ස්ථානයේදී මිල ගණන් විවෘත කරනු ලබන අතර ඒ සඳහා ඔබට හෝ ඔබගේ බලයලත් නියෝජිතයකුට ඒ සඳහා සහභාගී වීමට හැකියාව ඇත.

06. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය රේගු අධ්‍යක්ෂ ජනරාල් සතු වේ.

සභාපති,
දෙපාර්තමේන්තු මහා පරිමාණ ප්‍රසම්පාදන කමිටුව ,
ශ්‍රී ලංකා රේගුව,
රේගු මන්දිරය,
අංක 40,කෙළින් වීදිය,
කොළඹ 11.